# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 15 /2017**

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2017. 06.28

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**සහකාර ලේකම් / සහකාර ලේඛකාධිකාරී සහ සහකාර ගණකාධිකාරී / සහකාර මූල්‍යාධිකාරී / සහකාර අභ්‍යන්තර විගණක තනතුරුවල බඳවා ගැනීමේ පරිපාටි**

2011.03.10 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 948 හි නියම කර දක්වා ඇති සහකාර ලේකම් / සහකාර ලේඛකාධිකාරී සහ සහකාර ගණකාධිකාරී / සහකාර මූල්‍යාධිකාරී / සහකාර අභ්‍යන්තර විගණක තනතුරුවල බඳවා ගැනීමේ පරිපාටි කෙරෙහි සහ 2010.06.23 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 922 හි සඳහන් කර ඇති එම තනතුරුවලට අදාළ කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවන් කෙරෙහි ද ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. 2017.06.01 දින පැවති සිය 965 වන සභා වාරයේදී, ඉහත තනතුරුවල බඳවා ගැනීමේ පරිපාටි එම තනතුරුවලට බඳවා ගැනීම සඳහා අදාළ කර ගන්නා ක්‍රමවේදය හා සම්බන්ධව සංශෝධනය කිරීමට කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී.

03. ඒ අනුව, බාහිර හා අභ්‍යන්තර කාණ්ඩ යටතේ වන සියලු අපේක්ෂකයන්, ඔවුන්ගේ සුදුසුකම් තහවුරු කර ගැනීමකින් තොරව විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා කැඳවනු ඇති අතර ඉන් අනතුරුව ලිඛිත පරීක්ෂණයේ දී සාර්ථක වූ අපේක්ෂකයන්ගේ අයදුම්පත් පමණක් නිවේදනයේ සඳහන් අවසන් දිනට බඳවා ගැනීමේ පරිපාටි ප්‍රකාරව නියමිත සුදුසුකම් හා වෙනත් සුදුසුකම් සම්පූර්ණ කර ඇත්තේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා පරීක්ෂා කර බලනු ඇත.

04. අයදුම්කරුවන්ට සහකාර ලේකම් / සහකාර ලේඛකාධිකාරී සහ සහකාර ගණකාධිකාරී / සහකාර මූල්‍යාධිකාරී / සහකාර අභ්‍යන්තර විගණක යන එක් එක් තනතුර සඳහා වූ ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීමට එක් එක් කාණ්ඩය යටතේ වාර දෙක බැගින් හිමි වේ; එනම් යම් අභ්‍යන්තර අපේක්ෂකයෙකු අභ්‍යන්තර කාණ්ඩය යටතේ වාර 02ක් හා බාහිර කාණ්ඩය යටතේ වාර 02ක් ලෙස එනම්, කිසියම් තනතුරක් සඳහා කාණ්ඩ දෙක යටතේම පරීක්ෂණය සඳහා පෙනී සිටීමට යම් අයදුම්කරුවකු හිමිකම් ලබන්නේ නම් එක්ව ගත් විට ඔහු සඳහා වාර 04ක් ලැබේ. ඒ අනුව, අපේක්ෂකයන්ට හිමි වාර දෙක ගණනය කිරීම ඉදිරියේ දී පවත්වනු ලබන ඊළඟ ආසන්නතම ලිඛිත පරීක්ෂණයේ සිට ආරම්භ වනු ඇති අතර දැනටමත් පෙර පැවැති පරීක්ෂණ සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සඳහා ද මෙය අදාළ වනු ඇත.

05. බාහිර කාණ්ඩය යටතේ වන අයදුම්කරුවන් වයස අවුරුදු 22-30 අතර පසු විය යුතු අතර අභ්‍යන්තර කාණ්ඩය යටතේ වන අයදුම්කරුවන් වයස අවුරුදු 53 ට වැඩි නොවිය යුතුය.

06. කෙසේ නමුත්, ඉදිරියේ දී පැවැත්වෙන ලිඛිත පරීක්ෂණවලට පෙනී සිටීමට ඉහත 04 ඡේදයේ සඳහන් ආකාරයට වාර 02 භාවිත කිරීමට අවස්ථාව සැලසීම පිණිස, අභ්‍යන්තර අපේක්ෂකයන්ගේ අවුරුදු 53 වයස් සීමාව ඊළඟ ආසන්නතම බඳවා ගැනීම සඳහා පළ කරනු ලබන නිවේදනයේ අයදුම්පත් බාර ගන්නා අවසන් දිනයෙන් ආරම්භ වන වසර 05 ක කාල පරිච්ඡේදයක් සඳහා නොසලකනු ඇත.

*2 පිටුවට ...........*

07. ඒ අනුව සංශෝධිත හා අනුපිළිවෙලින් ඇමුණුම I හා ඇමුණුම II හි දක්වා කර ඇති සහකාර ලේකම් / සහකාර ලේඛකාධිකාරි සහ සහකාර ගණකාධිකාරි / සහකාර මූල්‍යාධිකාරි / සහකාර අභ්‍යන්තර විගණක තනතුරුවල බඳවා ගැනීමේ පරිපාටි 2017.07.03 දින සිට ක්‍රියාත්මක වනු ඇත.

08. කොමිෂන් සභා චක්‍රලේඛ අංක 922 හි සඳහන් කොට ඇති සහකාර ලේකම් / සහකාර ලේඛකාධිකාරි සහ සහකාර ගණකාධිකාරි / සහකාර මූල්‍යාධිකාරි / සහකාර අභ්‍යන්තර විගණක තනතුරුවලට අදාළ වන කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතා ද කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවල නියම කර දක්වා ඇති "සටහන" යන්නට "ඉංග්‍රීසි"යන වචනයට පසුව " විෂයයක් වශයෙන් " යන වචන එක් කොට සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටි සමඟ ඉදිරිපත් කෙරේ.

09. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අත්/කළේ මහාචාර්ය මොහාන් ද සිල්වා

සභාපති

පිටපත්:
1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරි / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරිවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. ආයතන/මණ්ඩපවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන්/ සහකාර ලේඛකාධිකාරිවරුන්
12. ආයතන/මණ්ඩපවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන්/ සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන් / සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

ලිපි ගොනු අංකය : යූජීසී /එච්ආර්/2/3/106

ටී/-